මගේ අංකය : SG/Admin/CS/5/18 – Annual Transfer (External) -2020
ඒකාබද්ධ සේවා අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2020.02. 13 දින

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්/අධ්‍යක්ෂ (මැ.සි.ආ.)/අධ්‍යක්ෂ(මුදල්)/ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් / මිනින්දෝරු අධිකාරීවරුන්,
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි,
කාර්මික හා පරිපාලන නිලධාරීවරුන් / පරිපාලන නිලධාරි,
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්,

**ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ**
**කළමනාකරණ සේවා නිලධාරි සේවය / ඒකාබද්ධ රියදුරු සේවය / කාර්යාල සේවක සේවය**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/1/AT/2019 හා 2020.02.07 දිනැති ලිපිය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/Trans/වා.ස්.මා./2020 හා 2020.02.11 දිනැති ලිපිය අනුව, වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ මෙයින් දැනුම් දෙමි.

02. ඒ අනුව 2020 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ හා සමාලෝචන කමිටු තීරණවල නිශ්චිත දිනයන් සඳහන් කර නොමැති ස්ථාන මාරුවීම් හා 2020.01.01 දින සිට 2020.02.19 දින දක්වා ක්‍රියාත්මක වන සේ අනුමත කර ඇති ස්ථාන මාරුවීම් 2020.02.20 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. තවද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සඳහා 2020.02.20 දිනට පසු වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් එම නිශ්චිත දින සිටම අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවද වැඩිදුරටත් දන්වමි.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අදාළ නිලධාරීන්ට දන්වා ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

Dampegama

එස්.ඩී.පී.ජේ. දාම්පෙගම
සර්වේයර් ජනරාල්

එස්.ඩී.පී.ජේ. දාම්පෙගම
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Governme**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: (94) 011- 2694560
ෆැක්ස් / தொலைநகல் / Fax: (94) 011- 2692254
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: dgcs@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: COM/Trans/වා.ස්.මා./2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.02.11

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්/

දෙපාර්තමේන්තු ප්‍රධානීන්/

දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන්

**<u>ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනා සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ - 2020</u>**

ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන් විසින්, ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු යෝජනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ www.psc.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව 2020 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ හා සමාලෝචන කමිටු තීරණවල නිශ්චිත දිනයන් සඳහන් කර නොමැති ස්ථාන මාරුවීම් හා 2020.01.01 දින සිට 2020.02.19 දින දක්වා ක්‍රියාත්මක වන සේ අනුමත කරන ලද ස්ථාන මාරුවීම් 2020.02.20 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. තවද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීම සඳහා 2020.02.20 දිනට පසු වෙනත් නිශ්චිත දිනයක් සඳහන් කර ඇති ස්ථාන මාරුවීම් එම නිශ්චිත දින සිටම අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අදාළ නිලධරයාට දන්වා ඒ අනුව ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වමි.

එස් .ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.

දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/1/AT/2019

ඔබේ අංකය
உமது இல.
Your No.
COM/Trans/
වා.ස්.මා./2020

දිනය
திகதி
Date
2020.02. 07

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා වලට අදාළ තීරණ දැනුම් දීම**

**<u>රාජ්‍ය භාෂා පරිවර්තක සේවය, රාජ්‍ය පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය, කාර්යාල සේවක සේවය, ඒකාබද්ධ රියදුරු සේවය</u>**

ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දින සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියළු ස්ථාන මාරු 2020.02.20 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ඉහත සඳහන් සේවාවන්වල 2020 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම්ද එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතුවේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේවුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05. 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියළුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදාහැරීමට කටයුතු කිරීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධාරියා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධරයකු ස්ථාන මාරුවිය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් පවතින අවස්ථාවකදී, අදාළ නිලධරයා අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්.ජේ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත :
අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් - කාරුණික දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / e-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**
අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9 இராஜமல்வத்தை வீதி பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல / My No.: PSC/APL/1/AT/2019
ඔබේ අංකය / உமது இல / Your No.: COM/Trans/වා.ස්.මා./2020
දිනය / திகதி / Date: 2020.02.11

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**<u>2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>රාජ්‍ය භාෂා පරිවර්තක සේවය, රාජ්‍ය පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරි සේවය, කාර්යාල සේවක සේවය, ඒකාබද්ධ රියදුරු සේවය</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2020.02.07 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ 02 වන ඡේදයේ අවසන් වගන්තිය පහත පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වා සිටිමි.

> "ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයන් ලබා දී ඇති ස්ථාන මාරුවීම් එසේ ලබා දී ඇති දිනවල සිට අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක විය යුතු වේ. "

03. එම ලිපියේ අනෙකුත් කරුණු නොවෙනස් ව පවතී.

එම්.ජේ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020
## රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ

කළමනාකරණ සේවා නිලධාරී සේවය

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | එච්.එම්.ජී.එල්. හිටිනායක මිය (අභියාචක - ආර්.එම්. සුනිල් ශාන්ත මයා) | ක.සේ.නි.III | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හපුතලේ | වාර්ෂික ස්ථාන මාරුව ක්‍රියාත්මකයි. (අභියාචකගේ 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝගය අවලංගු වේ.) |
| 2 | ජී.එම්.ඊ. වීරතුංග මිය | ක.සේ.නි. II | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, රත්නපුර | රත්නපුර තාක්ෂණ විද්‍යාලය (සමාලෝචන කමිටු තීරණ මගින් අවලංගු විය) | අභියාචක වෙත ලබා දී ඇති 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම. |
| 3 | එස්.එස්.සජ්නා මිය (අභියාචක - එම්.එම්.ටී.ජී.පී.එස්. තෙන්නකෝන් මිය) | ක.සේ.නි.III | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, මහනුවර | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | නව සේවා ස්ථානය : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 4 | ටී.එම්.පී. මල්ලවආරච්චි මිය (බී.ජී.එස්. උදයකුමාරි මියගේ අනුප්‍රාප්තිකයා) | ක.සේ.නි. I | කුරුණෑගල පොලිස් අධිකාරී කාර්යාලය | වයඹ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 5 | එස්.එම්.ඩී. රාජේන්ද්‍රන් මිය | ක.සේ.නි. I | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | නැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 6 | යූ.ජී.ඩී.කේ. කාරියවසම් මෙය (ඩී.කේ.එල්.පී. අමරසිංහ මියගේ අනුප්‍රාප්තිකයා) | ක.සේ.නි. I | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, ගාල්ල | දකුණු පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

## ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020
## රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ

කාර්යාල සේවක සේවය

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ඩබ්.ඒ.ජේ. ද සිල්වා මයා (අභියාචක - පී.එස්.එන්. පුෂ්පකුමාර මයා) | කා.සේ.සේ.I | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය, මාතර | දිස්ත්‍රික් ධීවර කාර්යාලය, මාතර | අභියාචකගේ ස්ථාන මාරුව අවලංගු කිරීම සහ මාතර ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත අනුප්‍රාප්තිකයෙකු පසුව ලබාදීමේ පදනම මත චක්‍රයේ අනෙකුත් ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම. |
| 2 | වයි.වී. කොතලාවල මිය | කා.සේ.සේ. III | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අභියාචකගේ ස්ථාන මාරුව අවලංගු කිරීම හා චක්‍රයේ අනෙකුත් ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම. |
| 3 | ඩී.එම්.ඩබ්.ආර්. මැණිකේ මිය (අභියාචක - බී.ජී. කපිල බණ්ඩාර මයා) | කා.සේ.සේ. I | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, බදුල්ල | ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, බදුල්ල | ස්ථාන මාරු චක්‍රය අවලංගු කිරීම. |
| 4 | එල්.ඒ.ශ්‍යාමා කුමාරි මිය | කා.සේ.සේ. III | කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාලය, කුරුණෑගල | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |
| 5 | ඩී.එම්.එන්. දසනායක මයා | කා.සේ.සේ. I | පුත්තලම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |
| 6 | ඊ.එස්.සෙනෙවිරත්න මයා (ජේ.ඒ.ආර්. බණ්ඩාර මයාගේ අනුප්‍රාප්තිකයා) | කා.සේ.සේ. විශේෂ | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පොළොන්නරුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |

# ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020
## රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ

ඒකාබද්ධ රියදුරු සේවය

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | එච්.පී.ආර්. අබේකෝන් මයා (අභියාචක - එල්.පී. රංජිත් මයා) | රියදුරු III ශ්‍රේණිය | ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලය, දොළුව | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගඟ ඉහළ කෝරළේ | ස්ථානමාරු චක්‍රය අවලංගු කිරීම. (වාර්ෂික ස්ථාන මාරු තීරණ සේවක අංක 010271,029230 සහ 039470) |
| 2 | පී.එන්.ඩී. පුෂ්පකුමාර මයා (අභියාචක - ජී.ජී.එන්.පී. බුද්ධික මයා) | රියදුරු III ශ්‍රේණිය | ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලය, ඇලපාත | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇහැළියගොඩ | ස්ථානමාරු චක්‍රය අවලංගු කිරීම. (වාර්ෂික ස්ථාන මාරු තීරණ සේවක අංක 058648 සහ 063164) |
| 3 | එස්.එච්.පී. කුමාර මයා (අභියාචක - කේ.කේ.සී.ද සිල්වා මයා) | රියදුරු III ශ්‍රේණිය | ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලය, තණමල්විල | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, තිස්සමහාරාමය | ස්ථානමාරු චක්‍රය අවලංගු කිරීම. (වාර්ෂික ස්ථාන මාරු තීරණ සේවක අංක 068451 සහ 063139) |
| 4 | එන්.ජී. සමන්තිලක මහතා | රියදුරු III ශ්‍රේණිය | ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලය,ගාල්ල | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, ගාල්ල | අභියාචක වෙත ලබාදී ඇති 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක කිරීම. (වාර්ෂික ස්ථාන මාරු තීරණ සේවක අංක 040378) |
| 5 | කේ.පී.ජේ. කොඩිකාර මහතා | රියදුරු III ශ්‍රේණිය | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, දියතලාව | ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |
| 6 | එච්.යූ. උපාලි මහතා (කේ.එල්.ජී.කේ. කුලසිංහ මයාගේ අනුප්‍රාප්තිකයා) | රියදුරු I ශ්‍රේණිය | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, අක්මීමන | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය,ගාල්ල | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |
| 7 | ජී.ජී.ආර්. බංඩාර මහතා (කේ.එස්.ඩබ්. කොකුරන්ගොඩ මයාගේ අනුප්‍රාප්තිකයා) | රියදුරු I ශ්‍රේණිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය, යටිනුවර | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |
| 8 | පී.ජී.කේ. විමලසේන මහතා (ආර්.එම්.එන්.බී. රණසිංහ මයාගේ අනුප්‍රාප්තිකයා) | රියදුරු විශේෂ ශ්‍රේණිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, පේරාදෙණිය | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය, දිගන | අභියාචනය නිශ්ප්‍රභ කිරීම. |